# මහනුවර රාජධානිය

**මහනුවර රාජධානිය හැඳින් වූ වෙනත් නම්**

- සෙංඛගලපුරය
- කන්දෙ නුවර
- කන්ද උඩරට
- උඩරට රාජධානිය

## *මහනුවර රාජධානිය*

- මහවැලි ගඟෙන් ආරක්ෂා වි තිබීම.
- උඩවත්ත කඳු වැටිය හා හන්තාන කඳුවැටියෙන් ආරක්ෂා වි තිබීම.
- උස් භූමියක පිහිටා තිබීම.
- බලන හුන්නස්ගිරි වැනි දුර්ග මාර්ග හරහා මහනුවර නගරයට ඇතුළු වීමට සිදුවිම.

## උඩරට රාජධානියේ රජවරු

## පළමු වන විමලධර්මසූරිය රජු



සීතාවක රාජසිංහ රජු ශිව ආගම වැළඳ ගැනීමත් සමඟ උඩරට ප්‍රභූන් රජු කෙරෙහි කලකිරීමට පත් විය. බෞද්ධ භික්ෂූන්ට එරෙහිව කටයුතු කිරීම නිසා භික්ෂූන්ද රාජසිංහ රජු කෙරෙහි කළකිරීමට පත් විය. එයින් ප්‍රයෝජන ගත් පෘතුගීසිහු ඔවුන්ගේ රැකවරණය යටතේ සිටි කරලියද්දේ බණ්ඩාරගේ බෑනා වූ යමසිංහ බණ්ඩාර උඩරට රජු වශයෙන් පත් කරනු ලැබීය. පෘතුගීසීන් විසින් ඔහුගේ ආරක්ෂාවට කොනප්පු බණ්ඩාර කුමරුද උඩරටට යැවිය. යමසිංහ බණ්ඩාර කෙටි කලකින් මිය යාම නිසා පෘතුගීසීන් යමසිංහ බණ්ඩාරගේ ලාබාල පුත් කුමරෙකු උඩරටට පාලනයට පත් කොට රූකඩ පාලනයක් ගෙන යාමට කටයුතු කරනු ලැබීය. මේ අවස්ථාවේදී ඉදිරියට පැමිණි කොනප්පු බණ්ඩාර කුමරු පෘතුගීසීන්ට එරෙහිව කටයුතු කරනු ලැබීය. පෘතුගීසීන් යටතේ දොන් ජුවාන් නමින් හෞතීෂ්ම ලබා සිටි කොනප්පු බණ්ඩාර කුමරු ක්‍රි.ව 1592 දී **පළමු වන විමලධර්මසූරිය** නමින් උඩරට රජ විය. උඩරට රාජධානිය තුළ පෘතුගීසී ගැති පාලනයද මෙමගින් අවසන් විය. මෙය උඩරට ඉතිහාසයේ වැදගත් සිදු වීමකි. ක්‍රි.ව 1592-1604 දක්වා පළමු වන විමලධර්මසූරිය රජු උඩරට රජු වශයෙන් බලයට පත් විය. මෙතුමාට උඩරට නීත්‍යානුකූල උරුමයක් නොතිබූ නිසා කරලියද්දේ බණ්ඩාරගේ දියණියක් වූ කුසුමාසන දේවිය දෝන කතිරිනා කුමාරිකාව විවාහ කර ගනිමින් නීත්‍යානුකූල උරුමය තහවුරු කර ගත්තේය.

**පළමු වන විමලධර්මසූරිය රජුගේ වැදගත්කම**

- විමලධර්මසූරිය රජු සීතාවක බලපෑමෙන් උඩරට රාජධානිය නිදහස් කර ගැනීම.
- උඩරට අලුත් රජ පෙළපතක් බිහි වීම.
- පෘතුගීසි බලයට එරෙහිව කටයුතු කිරීම. (ක්‍රි.ව 1594 දන්තුරේ සටන සහ ක්‍රි.ව 1602 බලන සටන)
- බුදු දහම නගා සිටුවීමට කටයුතු කිරීම.
- බුරුමයෙන් උපසම්පදාව ගෙන ඒම.
- ලංකාතිලකය ,ගඩොලාදෙණිය වැනි විහාර අලුත් වැඩියා කිරීමට කටයුතු කිරීම.
- ආරක්ෂාව සඳහා දෙගල්ගමුව විහාරයේ කුරහන් ගල තුළ සඟවා තිබූ දළදාව උඩරටට වැඩමවා තැන්පත් කරලීම.



## සෙනරත් රජතුමා (ක්‍රි .ව 1604-1635)

සාමකාමීත්වය අගය කළ රජෙකි. එම නිසා 1617 දී පෘතුගීසීන් සමඟ සාම ගිවිසුමක් ඇති කර ගත්තේය. නමුත් සෙනරත් රජුගේ කාලයේදීම පෘතුගීසි කපිතාන් ජනරාල් කොන්ස්තන්තිනෝද සා විශාල සේනාවක් සමඟ පැමිණ ඌව ප්‍රදේශය ආක්‍රමණය කළේය. රජුගේ පුතා වූ මහා අස්ථාන කුමරුන් විසින් උඩරට හමුදාවක් මෙහෙය වූ අතර **රන්දෙණිවලදී** දෙපාර්ශවය අතර ප්‍රබල සටනක් ඇති විය. මෙයින් පෘතුගීසීන් අන්ත පරාජයට පත් විය.

## දෙවන රාජසිංහ රජතුමා (ක්‍රි .ව 1635-1687)

සෙනරත් රජුගෙන් පසුව මහා අස්ථාන කුමාරයා දෙවන රාජසිංහ රජු බවය පත් විය. රජු පෘතුගීසීන් මෙරටින් නෙරපා දැමීමේ අදහසින් ලන්දේසී සහය ලබා ගැනිමට කටයුතු කළේය. දෙපාර්ශවය සමඟ එකතු වි පෘතුගීසීන් පළවා හැරීමට ප්‍රහාර එල්ල කළ අතර වර්ෂ 1658 දී ඔවුන් මෙරටින් පළවා හැරීමට කටයුතු කළේය. පෘතුගීසීන් අත්පත් කර ගෙන තිබූ ප්‍රදේශ රැසක් උඩරටට එකතු කර ගැනීමට රාජසිංහ රජුට හැකි විය. දෙවන රාජසිංහ රජුගේ කාලයේදී දියෝගෝද මේලෝ නම් කපිතන් ජනරාල්වරයා විශාල හමුදාවක් සමග 1638 දී උඩරට ආක්‍රමණය කළේය. ගන්නෝරුව වෙළේදී ඇති වූ මෙම සටනින් පෘතුගීසීන් අන්ත පරාජයට පත් විය. උඩරට රාජධානි ඉතිහාසයේ දීර්ග කාලයක් පාලන කටයුතු මෙහෙය වූ රජු වූයේ දෙවන රාජසිංහ රජුය.

## දෙවන විමලධර්මසූරිය රජතුමා (ක්‍රි. ව 1687-1707)

- දෙවන රාජසිංහ රජුගේ පුත්‍රයාය.
- ඉතා සාමකාමී පාලකයෙකි. ඔහු ලන්දේසීන් සමඟ සුහඳව කල් ගෙවීය.
- බුද්ධ ශාසනය නගා සිටුවීමට කටයුතු කළේය. බුරුමයෙන් උපසම්පදාව ගෙන්වා උඩරට උපසම්පදාව පිහිටුවීය.
- දළදා මාලිගාව ප්‍රතිසංස්කරණය කළේය.

## ශ්‍රී වීර පරාක්‍රම නරේන්ද්‍රසිංහ රජතුමා (ක්‍රි ව 1707-1739)

- දෙවන විමලධර්මසූරිය රජුගේ පුත්‍රයායා.
- උඩරට ඉතිහාසයේ දුර්වල පාලකයෙකු ලෙස සැළකේ.
- මෙකළ ප්‍රභූපන්තියේ බලය වර්ධනය විය.
- ඉන්දීය කුමාරිකාවක් විවාහ කර ගැනීමේ ප්‍රතිඵලයක් ලෙස රජකමට උරුම පුතෙකු ලැබී නොතිබීම නිසා නායක්කාර් වංශිකයෝ උඩරට බලයට පත් විය.

### අභ්‍යාස

1) ලංකා සිතියමක් ඇද මහනුවර පිහිටි ස්ථානය ලකුණු කරන්න.
2) ජයවීර බණ්ඩාර උඩරට රජු ලෙස සිටියදී කොට්ටේ රාජධානිය බෙදී පැවති කොටස් තුන නම් කරන්න.
3) ජයවීර බණ්ඩාරගෙන් පසුව උඩරට බලයට පත්වූයේ කවුද?
4) කරලියද්දේ බණ්ඩාර රජු කල උඩරට ජනතාව රජු කෙරෙහි අසතුටු වීමට හේතුව කුමක්ද?
5) දොන් ජුවාන් නමින් පෘතුගීසීන් යටතේ බෞතීස්ම ලැබුවේ කවුද?
6) සීතාවක රාජසිංහ රජු උඩරට රජු වශයෙන් කටයුතු කිරීමේදී ප්‍රභූවරුන් හට කලකිරීමක් ඇති වූයේ ඇයි?
7) කොනප්පු බණ්ඩාර කුමරා උඩරට රජවූයේ කිනම් නමකින්ද?
8) පළමු වන විමලධර්ම සූරිය රජුගේ රාජ්‍ය කාලය සඳහන් කරන්න.
9) පළමු වන විමලධර්ම සූරිය රජු විවාහ කර ගත් බිසව කවුද?
10) දෝන කතිරිනා කුමරිය හැදින්වූ තවත් නමක් ලියන්න.

